# ශ්‍රී ලංකාවේ ලිංගික බලහත්කාරය සම්බන්ධ නීතිමය රාමුව

Women and Media Collective
Established 1984

Norwegian Embassy
*Colombo*

# සංක්ෂිප්ත සටහන

BRIEFING NOTE

## ශ්‍රී ලංකාවේ ලිංගික බලහත්කාරය සම්බන්ධ නීතිමය රාමුව

### ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය

ශ්‍රී ලංකා පොලීසියේ සංඛ්‍යා ලේඛන මගින් පෙන්වා දෙන්නේ ස්ත්‍රී දූෂණ නඩු තුළ වරදකරුවන් වීමේ අනුපාතය දරුණු ලෙස පහළ මට්ටමක පවතින බවයි. සැබැවට නම් මෙය ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් නියම වශයෙන් ඊට අදාළ දඬුවම් නොලබා සිටීමකට යටත් කරයි. දඬුවම් නොලබා සිටීම මගින් ලිංගික අපරාධකරුවන් එහි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් බියක් නොමැතිව නැවත නැවත ලිංගික හිංසනය සම්බන්ධ වැරදි කිරීමට යොමු කිරීම සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයින් අපරාධ ගැන පැමිණිලි කිරීමට ඉදිරියට පැමිණීම ආදිය වළක්වනු ලබයි.

ප්‍රයෝජනවත් පැහැදිලි කිරීමක් සපයා ඇත. ස්ත්‍රී දූෂණය පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානය මගින් ස්ත්‍රී දූෂණය පිරිමියෙකුට එරෙහිව සිදුවනවිට එය ආවරණය නොකරන අතර, එවැනි අපරාධයක් සිදුවන 365 (ආ) වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට සමාන ආරක්ෂාවක්, පුරුෂයින්ට සහ පිරිමි ළමුන්ට ලබා නොදේ.

ස්ත්‍රී දූෂණයට ලක්වූ අයෙකුගේ ලිංගික ඉතිහාසය අධිකරණයට ගෙන ඒමට අවසර දෙන සාක්ෂි ආඥා

| | 2016 | | | 2017[2] | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වාර්තා වූ සිද්ධි ප්‍රමාණය | නිදහස් වූ අයගේ එකතුව | වරදකරුවන් වූ ප්‍රමාණය | වාර්තා වූ සිද්ධි ප්‍රමාණය | නිදහස් වූ අයගේ එකතුව | වරදකරුවන් වූ ප්‍රමාණය | වාර්තා වූ සිද්ධි ප්‍රමාණය | නිදහස් වූ අයගේ එකතුව | වරදකරුවන් වූ ප්‍රමාණය |
| ස්ත්‍රී දූෂණය | 346 | 9 | 0 | 290 | 9 | 0 | 339 | 5 | 0 |
| කැමැත්ත සහිත ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | 1394 | 11 | 0 | 1204 | 7 | 0 | 1199 | 10 | 0 |
| කැමැත්ත රහිත ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය | 291 | 4 | 0 | 232 | 3 | 0 | 248 | 4 | 0 |

ශ්‍රී ලංකාව තුළ ලිංගික හිංසනය සම්බන්ධයෙන් ඇති නීති මූලිකවම ඇතුළත් වී තිබෙන්නේ 1883 දී පැනවූ දණ්ඩ නීති සංග්‍රහයේය. ලිංගික හිංසනය සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය තුළ ඇති විධිවිධාන 1995, 1998 සහ 2006 යන වසරවලදී සංශෝධනයට ලක් වී ඇත. කෙසේවෙතත්, තවමත් සැළකිලිමත් විය යුතු කාරණා කිහිපයක් ඇත. එනම්, වෛවාහික ස්ත්‍රී දූෂණ අපරාධයක් ලෙස හඳුනා නොගැනීම, ලිංගික හිංසනය සම්බන්ධයෙන් තේරුම් ගැනීමට ප්‍රධාන වන 'කැමැත්ත' සම්බන්ධයෙන් නිර්වචනයක් නොමැති වීම, සහ ස්ත්‍රී දූෂණ නඩු තුළ පුරුෂ පක්ෂයට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැති වීම තුළ නීතියට සැළකියයුතු ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. දකුණු ආසියානු කලාපය තුළ නේපාලය, භූතානය සහ මාලදිවයින ස්ත්‍රියකගේ වෛවාහික ස්ත්‍රී දූෂණය වරදක් ලෙස හඳුනාගෙන ඇත. 2013 දී සංශෝධන එක්කළ ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය මගින් ලිංගික හිංසනයේ ක්‍රියාකාරකම්වල පුළුල් වපසරියක් ආවරණය

කිරීම සඳහා ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් නිර්වචනය ප්‍රසාරණයකොට ඇති අතර, 'කැමැත්ත' පිළිබඳව

පනතේ 155 වැනි වගන්තියේ අන්තර්ගත සාක්ෂි රීතිය විසින් වින්දිතයින්ට දොස් පැවරීම ආයතනීකරණය කරනු ලබයි. වින්දිතයින්ට දොස් පැවරීම තුළ ලිංගික අපරාධකරුවන් භුක්ති විඳින ප්‍රතිවිපාක නොලබා සිටීම යන්න ශක්තිමත් කරයි. වෙනත් කිසිදු ආකාරයක සාපරාධී වරදක් සම්බන්ධයෙන් වින්දිතයාගේ චරිතය ප්‍රශ්නයක් නොවන නමුත් ස්ත්‍රියකට එරෙහිව දූෂණයක් සිදුවන තැනදී පමණක් මෙම නීතිය මගින් ලිංගිකත්වය පදනම්කොට ගෙන වෙනස්කොට සළකනු ලබයි.

පූර්ව නඩු තීන්දු නිරීක්ෂණයේදී පෙනී යන්නේ වැරදිකරුගේ වයස අවුරුදු 18 ට වැඩි වී තිබුණු විට පවා ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් පැනවිය යුතු අනිවාර්ය අවම දණ්ඩනය මග හැරීම සඳහා අධිකරණ අභිමතය භාවිතාකොට ඇති බවයි. පූර්ව නඩු වල නඩු තීන්දුන්හි භාෂාව සම්බන්ධයෙන් විමසුමකින් පෙන්වා දෙන්නේ වෙනස්කොට සැළකීම් සහිත ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම්කොට ගත් ඒකාකාර ස්වභාවයන් / සැළකීම්, උසාවි තුළට රිංගා ඇති බවයි.[1] මෙමගින් නෛතික අධ්‍යාපනයේ ප්‍රතිසංස්කරණ සඳහා සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ඒකාකාර ස්වභාවයන්

අභියෝගයට ලක් කිරීම සඳහා පුළුල් නෛතික පුහුණුවක් අවශ්‍ය බව ඉල්ලා සිටී. ලිංගික හිංසනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතියේ ඇති තවත් සැලකිය යුතු මූලික කාරණයක් වන්නේ සමලිංගික සහකරුවන් අතර එකඟතාවයකින් යුතුව සිදුවන ලිංගික ක්‍රියාවන් අපරාධ ලෙස සළකන යල්පැන ගිය නීතිවල නිරන්තර වලංගුභාවයයි.

2018 වසර තුළ ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහයෙහි සමලිංගික සහකරුවන් අතර සිදුවන ලිංගික ක්‍රියාවන් අපරාධ ලෙස සැළකූ විධිවිධානය අර්ථනිරූපණය කරන ලදී.[2] ඉන්දියානු දණ්ඩ නීති සංග්‍රහය ද ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය හා සමානවම බ්‍රිතාන්‍ය පාලන සමයේදී නීතිගත වූවකි. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් 1967 දී පෞද්ගලිකව සිදුවන සම ලිංගික ක්‍රියාව සාපරාධී අපරාධයක් ලෙස සැළකීම නවතා දමන ලදී. තවද සමාන ලිංගික සහකරුවන් / සහකාරියන් අතර සිදුවන ලිංගික ක්‍රියා නේපාලය තුළද අපරාධයක් ලෙස සැළකීම නවතා දමා ඇත. භූතානයේ එම නීතිය ප්‍රතිසංස්කරණයට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කොට ඇත.

මෑතකාලීන නඩු විභාගයකදී, විනිශ්චයකාර අලුවිහාරේ මහතා සටහන් කරන්නේ *'සමකාලීන චින්තනය තුළ වැඩිහිටියන් අතර කැමැත්තෙන් සිදුවන ලිංගික ක්‍රියාව සම්බන්ධයෙන් රාජ්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම නොකළ යුතු අතර එය අවුරුදු ගණනාවක් තිස්සේ අපරාධ ගණයෙහි ලා සැළකීමට ඉඩ නොහැරිය යුතු සහ සමහරවිට මෙයට මග*

**මෙම ප්‍රජාවේ සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට ඉතිහාසය විසින් සමාව අයැදිය යුතුය. මෙම ප්‍රජාවේ සාමාජිකයින්ට පළිගැනීම් සහ හිංසා පීඩාවලින් පිරි ජීවිතයක් ගත කිරීමට සිදු විය. මෙය සිදුවූයේ සමලිංගිකත්වය යනු සම්පූර්ණයෙන්ම ස්වභාවික තත්ත්වයක් බව සහ මානව ලිංගිකත්වයේ පරාසයක කොටසක් බව පිළිගැනීමට බහුතරයකට තිබූ නොදැනුවත්භාවය නිසාය.**

*පෙන්වන තාර්කිකය වන්නේ එංගලන්තය තුළ පුංමෛථුනය සහ ගුද මෛථුනය පිළිබඳ වරද අවලංගු කිරීමයි*[3] යනුවෙනි. විද්‍යාත්මක සාධක විභාග කිරීමේ දී කෙනෙකුගේ ලිංගික නැඹුරුව යන්න ජානමය, හෝර්මෝනමය, වර්ධනමය, සමාජ හෝ සංස්කෘතික බලපෑම් මගින් තීරණය වූවක්ද, නැතිනම් මේවායේ එකතුවක්ද යන්න මගින් තීරණය වන බවයි. LGBT ප්‍රජාව ඔවුන්ගේ ලිංගික නැඹුරුව තෝරාගැනීම සම්බන්ධයෙන් ඉතාම ස්වල්ප අත්දැකීම් හෝ ඒ සඳහා ඔවුනට තෝරාගැනීමක් නොමැති බව දක්වමින් ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය මගින් පහත ප්‍රකාශය සිදු කරයි:[4]

ඉහත කරුණු සැළකිල්ලට ගනිමින් ප්‍රමාණවත්/හරවත් නීති (substantive law) සහ ක්‍රියාපටිපාටි සඳහා පහත ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලැබේ.

- වස්තුවක් හෝ අපරාධකරුගේ හෝ වෙනත් අයෙකුගේ ශරීරයේ කොටසක් මගින් කරන ස්ත්‍රී දූෂණය ඇතුළත් කිරීම සඳහා ස්ත්‍රී දූෂණය පිළිබඳව නිර්වචනය පුළුල් කිරීම.
- කැමැත්ත දැනුවත් තෝරාගැනීමක් ලෙස පිළිගැනීම සහ කැමැත්ත නොමැතිවීම මත පදනම්ව කෙරෙන ස්ත්‍රී දූෂණය පිළිබඳව නිර්වචනයක් සකස් කිරීම.
- වෛවාහික ස්ත්‍රී දූෂණය සාපරාධී අපරාධයක් බවට පත් කිරීම.
- ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සම්බන්ධයෙන් ඇති නීතිය සහ භාවිතයේ ඇති විෂමතාවය පිළිබඳව ආමන්ත්‍රණය කිරීම සාකච්ඡාවට ගැනීම.
- ස්ත්‍රී දූෂණයට ලක්වූ ස්ත්‍රීන්ගේ ලිංගික ඉතිහාසය ස්ත්‍රී දූෂණ නඩුවලදී වලංගු නොවන, බාරගත නොහැකි බවට දක්වමින් සාක්ෂි ආඥා පනතේ 155 වගන්තිය සංශෝධනය කිරීම.
- සමලිංගික පාර්ශ්වකරුවන් අතර ලිංගික ක්‍රියාව සාපරාධී වරදක් බවට පත් නොකිරීම සඳහා 365 සහ 365 :අ) යන වගන්ති ඉවත් කිරීම.
- ලිංගික දූෂණය (rape) ඇතුළුව ලිංගික හිංසනය සම්බන්ධයෙන් පුරුෂයින්ගේ සහ පිරිමි ළමුන්ගේ ආරක්ෂා වැඩි දියුණු කිරීම.
- අධිකරණ පුහුණුව සහ නීති අධ්‍යාපනයට කරන ප්‍රතිසංස්කරණ හරහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කොටගත් ඒකාකාර ස්වභාවයන්/සැළකීම් සහ අගතීන්වලට ආමන්ත්‍රණය කිරීම සහ එය සාකච්ඡාවට ගැනීම.

1. OIC Maradana v. Galabada Payagalage Sanath Wimalasiri, SC Appeal No 32/2011, 11-12 Available at http://www.supremecourt.lk/images/documents/sc_appeal _32_11.pdf
2. Grave Crimes Abstract for the year 2016 (2017 Sri Lanka Police) Available at https://www.police.lk/images/others/crime_trends/2016/grave_crime%20.pdf
3. Grave Crimes Abstract for the year 2017 (2018 Sri Lanka Police) Available at https://www.police.lk/images/others/crime_trends/2017/grave_crime-2017.pdf
4. Grave Crimes Abstract for the year 2018 (2019 Sri Lanka Police) Available at https://www.police.lk/images/crime/2019/disposal_of_grave_crime_policedivision.pdf
5. SandaniYapaAbeywardene, 'Images, myths and Stereotypes: A Critical Discourse Analysis of the Construction of the 'female' in Judicial Pronouncements on Rape in Sri Lanka', 37-44, LST Review: Queering the Law, https://www.forum-asia.org/uploads/wp/2017/03/LST-Review-Queering-the-Law-Dec-2016.pdf
6. *Navtej Singh Johar& others vs. Union of India* (2018) W.P. (Crl) No 76 of 2016 Available at https://sci.gov.in/supremecourt/2016/14961/14961_2016_Judgement_06-Sep-2018.pdf
7. OIC Maradana v. GalabadaPayagalageSanathWimalasiri, SC Appeal No 32/2011, 11-12 Available at http://www.supremecourt.lk/images/documents/sc_appeal_32_11.pdf.
8. At page 50

මැයි 2021

ප්‍රකාශනය :

**කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය**
56/1, සරසවි පටුමග, කාසල් වීදිය, කොළඹ 08, ශ්‍රී ලංකාව
විද්‍යුත් තැපෑල: wmcsrilanka@womenandmedia.org
වෙබ්: womenandmedia.org
ෆේස්බුක්: https://www.facebook.com/womenandmediacollective
ට්විටර්: https://twitter.com/womenandmedia

Women and Media Collective
Established 1984

Norwegian Embassy
Colombo